1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/13/CIR.COM.(3) ඔබේ අංකය / உமது இல / Your Ref. දිනය / திகதி / Date 2026.05.13

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/1/1/01 හා 2026.05.11 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛය, චක්‍රලේඛය නිකුත් කළ දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2026.05.11 දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2026 | 2026.04.30 | 2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රතිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299 විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
## ஆளுநர் செயலகம் - தென் மாகாணம்
## Governor's Secretariat - Southern Province

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number | GS/SP/ 1/1/01 | ඔබේ අංකය / உமது இல. / Your Number | දිනය / திகதி / Date: 2026.05. 11 |

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීම.</u>**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක: CSS/7/03/13/CIR.COM(3) හා 2026.05.07 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව,පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව **2026.04.30** දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **11/2026** හි ඇතුලත් විධිවිධාන සමගින් නිකුත් කළ දින සිට දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීමට 2026.05.11 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඉහත සඳහන් චක්‍රලේඛ පිටපතක් මේ සමග අමුණා ඔබ වෙත කාරුණිකව යොමු කරමි.

කේ.පී.එස්. දමයන්ති
පරිපාලන නිලධාරී,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 11/2026

මගේ අංකය : EST-4/03/PMT/0201(I)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.04.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම.**

2026 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත පරිදි, රාජ්‍ය අංශයේ ආයතනවල තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනමින් මේ වන විට සේවයේ නියුතුව සිටින සේවකයන් සම්බන්ධයෙන් සහ තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනමින් සේවයේ යෙදී සිට චක්‍රලේඛ විධිවිධාන අනුව ස්ථිර පත්වීම් ලැබී ඇති නමුත් එම පත්වීම් විධිමත් නොවන සේවකයන් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි කටයුතු කිරීමට 2026.04.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 25/2014(I) නැවත බලාත්මක කළ, 2019.09.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 අනුව 2019.09.01 දිනට පහත සුදුසුකම් සපුරා ඇති මේ වන විට සේවයේ නියුතු සේවකයන්ට එදින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබා දිය යුතු ය. මෙහි දී,

I. 2019.09.01 දිනට වැඩකරන දින 180ක සතුටුදායක සහ අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය. (විධිමත් නිවාඩු දින සහ රජයේ නිවාඩු දින නිසා සේවා ඛණ්ඩනයක් සිදු නොවේ).

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 25/2014(I) නැවත බලාත්මක කළ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 චක්‍රලේඛයට අනුව අදාළ තනතුරට නියමිත සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014හි සඳහන් සේවා ගණවලට අයත් විය යුතු අතර 2019.09.01 දිනට සුදුසුකම් සපුරන තනතුරේ ම/ ආයතනයේ ම එකම වැටුප් පරිමාණය තුළ මේ වන විට අඛණ්ඩව සේවයේ යෙදී සිටිය යුතු ය.

IV. 2019.09.01 දින සිට ස්ථිර පත්වීම් ක්‍රියාත්මක වුව ද, මෙම චක්‍රලේඛය නිකුත් කරන දිනට අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පවතින්නේ නම් පමණක් අදාළ පුරප්පාඩු සලකා ස්ථිර පත්වීම් ලබා දීම කළ යුතු ය. එසේ වුවද, අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු නොමැති නම් තනතුර දරන්නාට පෞද්ගලික වන සේ ස්ථිර පත්වීම පවත්වාගෙන යා යුතු අතර, එම තනතුර දරන්නා වෙනත් සේවයකට අන්තර්ග්‍රහණය වීමෙන්, උසස්වීමෙන්, විශ්‍රාම යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් හේතුවක් නිසා පුරප්පාඩු වූ විට එම තනතුර අහෝසි වූවා සේ සැලකිය යුතු ය.

V. දරන්නාට පෞද්ගලික වන සේ අදාළ ස්ථිර පත්වීම ලබා දී ඇති විට, අදාළ නිත්‍ය තනතුරුවල පුරප්පාඩු ඇති වූ අවස්ථාවක දී නව බඳවා ගැනීම් නොකළ යුතු අතර මෙම සේවකයන් අදාළ පුරප්පාඩුවලට ගැළපුම් කිරීම කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමතියෙන් සිදු කළ යුතු ය.

VI. හිඟ වැටුප් ගෙවීමකින් තොරව, නිලධරයන්ගේ වැටුප් සහ නිවාඩු, ස්ථිර පත්වීම ක්‍රියාත්මක වන දින සිට ස්ථිර පත්වීමකට අදාළ වන පරිදි සංශෝධනය කළ යුතු ය.

VII. 2014.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014(I) අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීම සඳහා පුහුණු පාඨමාලා සංවිධානය කර ස්ථිර පත්වීම් ලබා දීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළ යුතු ය.

03. මෙම චක්‍රලේඛයට අනුව ස්ථිර පත්වීම් ලබා දෙන සේවකයන් සම්බන්ධයෙන් ඇමුණුම 01 හා ඇමුණුම 02 හි දක්වා ඇති ආකෘති ප්‍රකාරව ඒ ඒ ආයතනවල කාර්යය මණ්ඩලය අනුමත කිරීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත තොරතුරු ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු ය.

04. ඉහත 02 පරිදි ස්ථිර පත්වීම් ලබා දෙන සේවකයන්ට ඔවුන්ගේ තනතුරුවල ස්ථිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දී මෙම චක්‍රලේඛය නිකුත් කළ දින සිට අවුරුදු 01ක කාලයක් තුළ සේවා ස්ථිරත්වය ලබා දිය යුතු අතර මේ දක්වා සක්‍රිය සේවයේ නිරත සේවකයන් පරිවාස කාලය සම්පූර්ණ කර ඇති බව සලකා කටයුතු කළ යුතු ය. මෙහි දී අංක 2310/29 හා 2022.12.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළකරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ප්‍රකාරව පරිශිෂ්ට 03 හි VII පරිච්ඡේදයේ 89 සහ 90 වගන්ති අනුව නිකුත් කරන විධිමත් පත්කිරීමේ ලිපියේ අනු අංක 06 යටතේ දක්වා ඇති කරුණු සඳහා "මෙම පත්වීම 2019.09.01 දින සිට ක්‍රියාත්මක වන බැවින් එදින සිට ස්ථිර පත්වීම් ලබා දෙන දිනය තෙක් කාලය පරිවාස කාලය ලෙස සලකනු ලැබේ." ලෙස සුදුසු පරිදි ඇතුළත් කළ යුතු ය.

05. ඉහත 02 පරිදි ස්ථිර පත්වීම් ලබා දීමෙන් පසු දෙපාර්තමේන්තුගත තනතුරුවල අතිරික්තව සිටින සේවකයන්ට වෙනත් ආයතනයක ඇති පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා / ආයතන ප්‍රධානියා වගබලා ගත යුතු අතර, ඒ පිළිබඳව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතු ය.

06. ඒකාබද්ධ සේවයට අයත් ප්‍රාථමික සේවා ශ්‍රේණියේ තනතුරුවල තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවය කළ සේවකයන් සඳහා විධිමත් පත්වීම් ලිපි ලබා දීමට හා සේවා ස්ථානවල සිටින ඒකාබද්ධ සේවයට අයත් තනතුරුවල ස්ථිර පත්වීම් ලබන අතිරික්ත සේවකයන් වෙනත් පුරප්පාඩු පවතින සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පැවරේ.

07. 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 2014.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014(I) අනුව ස්ථිර පත්වීම් ලබා දී, තනතුරු අනුමතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ආයතන ප්‍රධානීන් විසින් ඉදිරිපත් කළ ඉල්ලීම් සම්බන්ධයෙන් තවදුරටත් තනතුරු අනුමතිය ලබා දිය යුතුව පවතින්නේ නම්, ඒ සඳහා අවශ්‍ය අනුමතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කඩිනමින් ලබා දිය යුතු ය.

08. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 25/2014(I) නැවත බලාත්මක කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනමින් සේවය කරන සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් නිකුත් කළ චක්‍රලේඛ විධිවිධානවලට වෙනස්ව ස්ථිර පත්වීම් ලබා දී තිබීම නිසා නැවත මෙම

චක්‍රලේඛය අනුව ස්ථිර පත්වීම් ලබා දිය නොහැකි සේවකයන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු ය.

i. තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම සඳහා නිකුත් කළ චක්‍රලේඛ අනුව තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගත් දිනට වයස අවුරුදු 45 ඉක්මවා නොමැති සේවකයන් සඳහා චක්‍රලේඛයට අනුව ස්ථිර පත්වීම් ලබා දිය යුතු දිනය නොවන වෙනත් දිනයක ස්ථිර පත්වීම් ලබා දී ඇති, චක්‍රලේඛය අනුව අනෙකුත් සුදුසුකම් සපුරා ඇති සේවකයන්ගේ ස්ථිර පත්වීම්, විධිමත් පත්වීම් ලෙස පිළිගත යුතු ය.

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 25/2014(I) නිකුත් කිරීමට පෙර තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම සඳහා නිකුත් කළ චක්‍රලේඛ අනුව අනෙකුත් සුදුසුකම් සපුරා තිබුණ ද තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනමින් බඳවා ගන්නා අවස්ථාවේ දී වයස අවුරුදු 45 ඉක්මවා තිබූ සහ එය නොසලකා ස්ථිර පත්වීම් ලබා දී ඇති සේවකයන්ගේ පත්වීම් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල යටතේ පත්වීම් ලෙසට කල්පිතව පරිවර්තනය කර ඒ අනුව සේවය අවසානයේ දී ලබා දෙන ප්‍රතිලාභ තීරණය කළ යුතු ය. එවැනි පත්වීමක් ලබා මේ වන විට සේවය අවසන් කර විශ්‍රාම වැටුපක් නොලැබෙන සේවකයන්ට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල යටතේ පත්වීමකට අදාළව හිමිවිය යුතු රජයේ දායක මුදල සහ නිලධරයාගෙන් අය කරගත් වැන්දඹු අනත්දරු දායක මුදලක් වේ නම් එම මුදල නිලධරයා හට එකවර ගෙවිය යුතු ය.

09. ඉහත විධිවිධාන අනුව ස්ථිර පත්වීමක් ලැබීමට සුදුසුකම් ලැබුව ද වෙනත් ආකාරයකින් රජයේ රැකියාවක් ලැබීමට නුසුදුස්සෙකු වන කිසිදු තැනැත්තෙකුට මෙම චක්‍රලේඛය යටතේ ස්ථිර පත්වීමක් ලබා නොදිය යුතු ය.

10. මින් ඉදිරියට, අදාළ තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා නොමැති සහ අනුමත කාර්යය මණ්ඩලයෙන් පරිබාහිරව තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත අනුමත බඳවා ගැනීම් පටිපාටි හෝ සේවා ව්‍යවස්ථාවන්ට පරිබාහිරව කිසිදු බඳවා ගැනීමක් සිදු නොකළ යුතු ය. එලෙස බඳවා ගැනීමට කටයුතු කරනු ලැබුවහොත්, එසේ ක්‍රියාකිරීමේ වගකීම අවස්ථෝචිත පරිදි පත්කිරීම් බලධරයා සහ/ හෝ පත්වීම් ලිපිවලට අත්සන් තබන නිලධරයා විසින් දැරිය යුතු ය.

11. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2696478
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ad-2-est@pubad.gov.lk

ඇමුණුම 01

**2019.09.01 දිනට තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගත් සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම.**

අමාත්‍යාංශය :..............................................
දෙපාර්තමේන්තුව :..............................................
ආයතනය :..............................................

| ස්ථිර කරන ලද සේවකයන්ගේ තොරතුරු | | | තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවා ගැනීම | | ස්ථිර පත්වීම් ලබා දීම | |
|---|---|---|---|---|---|---|
| නම | උපන්දිනය | ජා.හැ.ප.අංකය | බඳවාගත් දිනය | බඳවාගත් තනතුර | පත්වීම් ප්‍රදානය කළ දිනය | තනතුර |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඇමුණුම 02

**2026.04.30 දිනට තාවකාලික, අනියම්(දෛනික), ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගත් තනතුරු සම්බන්ධයෙන් තොරතුරු කැඳවීම.**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය...........................................................................................

| තනතුරු නාමය<br><br>a | වැටුප් කේතය<br><br>b | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2026.04.30 දිනට අනුමත තනතුරු සංඛ්‍යාව<br><br>c | 2026.04.30 දිනට පවතින තත්‍ය තනතුරු සංඛ්‍යාව<br><br>d | පුරප්පාඩු (අතිරික්ත/ඌනතා)<br><br>e<br>(c-d) | රා.ප.ච.11/2026 චක්‍රලේඛය අනුව සේවා ස්ථිරත්වය ලබා දෙන සංඛ්‍යාව<br><br>f | අතිරික්ත/ඌනතා (රා.ප.ච.11/2026 විධිවිධාන අනුව කටයුතු කිරීමෙන් පසුව)<br><br>g |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |